 ISSN 2362-0412

# සුළු අපනයන බෝග වගාව ප්‍රවර්ධනය පිළිබඳ ගැටලු අධ්‍යයනය කිරීම : බද්දෙගම සහ මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇසුරිනි

කේ. චම්පිකා දොළමුල්ල සහ ඒ. දිනුක ගුණවර්ධන

*ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

## සංක්ෂේපය

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් ආර්ථික සුරක්ෂිතතාව වර්ධනය කිරීමට අපනයන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය ය. එහි දී ශුද්ධ අපනයනයන්හි ඉහළ ම අගයක පවතින කෘෂි අපනයන තේ, පොල්, රබර් ත්‍රිත්වයට පමණක් කේන්ද්‍රගත විමේ ගැටලුවට පිළියම් ලෙස කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි සාදික්කා වැනි සුළු අපනයන බෝග ප්‍රවර්ධනය කිරීම වැදගත් ය. ඒ අනුව මෙම පර්යේෂණයේ අරමුණ සුළු අපනයන බෝග ප්‍රවර්ධනය කිරීම සඳහා එම බෝගයන්හි වගා කිරීම හා අලෙවිය පිළිබඳ පවතින ගැටලු හඳුනාගනිමින් ඊට විසඳුම් දේශීය විදේශීය, සාම්ප්‍රදායික මෙන් ම නූතන ක්‍රමවේද හා දැනුම භාවිතා කිරීමෙන් ලබා දීමට පවතින හැකියාව අධ්‍යයනය කිරීම ය.

පර්යේෂණය සඳහා මිශ්‍ර ක්‍රමවේදය භාවිතා කළ අතර ප්‍රාථමික සහ ද්විතීයික තොරතුරු භාවිතා කරනු ලැබිණි. සුළු අපනයන බෝග බහුල ප්‍රදේශ වන ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම සහ මාතර දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ග්‍රාම නිලධාරී වසම් 6 ක් නියෝජනය වන පරිදි නියැදි ඒකක හැටකින් භෝග වගා කිරීම හා අලෙවියට පවතින ගැටලු සහ අපේක්ෂා කරනු ලබන විසඳුම් පිළිබඳ ප්‍රාථමික තොරතුරු හා දත්ත රැස්කරනු ලැබිණ. දත්ත විස්තරාත්මක හා කයි වර්ග පරීක්ෂාව භාවිතා කරමින් විශ්ලේෂණය කරන ලදි. පර්යේෂණයේ ප්‍රතිඵල මත ගොවීන් සඳහා වගා කිරීමට මූල්‍ය අපහසුතා පැවතීම, වගා කිරීම, අස්වනු ලබා ගැනීම, අලෙවිය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොතිබීම, අලෙවි මධ්‍යස්ථාන දුලභ වීම, නිසි මිලක් නොලැබීම යනාදි ගැටලු මත සුළු අපනයන බෝග වගා කිරීම අඩු වීමට හේතු වි ඇති බව හඳුනාගත හැකි විය. ගැටලු අවම කරමින් බෝග ප්‍රවර්ධනයට රාජ්‍ය මැදිහත් වීම, නිසි ප්‍රතිපත්තියක් සකස් කිරීම, ආධාර දීම සිදුකළ යුතු අතර වගා කිරීම, රැකබලා ගැනීම, නඩත්තුව, අස්වැන්න සකස් කිරීම, කල්තබා ගැනීම පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ගොවි නිලධාරීන් මගින් ගොවීන්ට ලබාදිම සිදු කළ යුතු ය. එමෙන් ම මෙම වගා සිදුකිරීමේ පාරම්පරික ක්‍රම, අස්වනු කල්තබා ගැනීම පිළිබඳ දැනුම නූතන ගොවි පරම්පරාවට ලබාදීම සහ හුවමාරු කිරීම ද වැදගත් වන බව ගම්‍ය විය. එමෙන් ම මෙම බෝග අමුද්‍රව්‍ය ලෙස නොව නිමි ද්‍රව්‍ය, අර්ධ නිමි ද්‍රව්‍ය ලෙස සකස් කිරීමේ කාර්මික ක්‍රියාවලිය සඳහා ද්විත්ව පරතර න්‍යායට අනුව විදේශ ඍජු ආයෝජන සුළු අපනයන බෝග ප්‍රවර්ධනයට යොමු කිරීම යනාදිය තුළින් සුළු අපනයන බෝග ප්‍රවර්ධනය කිරීමේ ශක්‍යතාව ලැබෙන බව ද අධ්‍යයනය මගින් හඳුනාගත හැකි විය.

ප්‍රමුඛපද : සුළු අපනයන බෝග, වගා කිරීම, අලෙවිය, දැනුම හුවමාරුව